# හින්දු දහමේ ප්‍රචලිත පාර්වතී දෙවඟන පිළිබඳ අධ්‍යයනයක්

*මදුෂානි, ඉෂාරා*[1]

හින්දු ආගමේ පවත්නා දේව සංකල්පය මෙන්ම දේවතාවියන් වන්දනාමාන කිරීමද ප්‍රධාන වැදගත්කමකින් යුතු චාරිත්‍රයක් බවට පත්ව තිබේ. හින්දු දේවතාවියන් අතර ප්‍රධාන තැනක් ගනු ලබන '**සරස්වතී**', '**පාර්වතී**', '**ලක්ෂ්මී**', '**දුර්ගා**' සහ '**කාලි**' වැනි දේවතාවියන් මෙන්ම ප්‍රාදේශීය වශයෙන් වැඳුම්-පිදුම් කරන දේවතාවියන්ද රාශියක් දක්නට ලැබෙන අතර මුල් කාලීනව ශිව, විෂ්ණු දේව වන්දනය ප්‍රධාන වශයෙන් ප්‍රචලිතව පැවතියද දේවතාවියන් වන්දනය එතරම් සිදු නොවුණි. නමුත් ගුප්ත යුගය වනවිට දේවතාවියන් වන්දනය ප්‍රචලිත විය. මෙලෙස වන්දනාමානයට ලක් වූ ප්‍රධාන දේවතාවියක් ලෙස පාර්වතී දෙවඟන සුවිශේෂී වේ. '**මීනාචි**', '**උමා**', '**පරශක්ති**', '**ගෞරි**' ආදි අන්වර්ථ නම් රාශියකින් ඇය හඳුන්වනු ලබයි. පාර්වතී දෙවඟන ශිවගේ භාර්යාව වේ. ඇය කාරුණික දෙවඟනක් ලෙස නිරූපණය වන අතරම දුර්ගා, කාලි, චාණ්ඩි වැනි බියකරු ස්වරූපයන්ද නිරූපණය කරනු ලබයි. 12වන සියවසට පමණ අයත් වන ප්‍රතිමාවන්හි පාර්වතී දෙවඟන පූජනීයත්වයෙන් දක්වා තිබේ. එමෙන්ම '**ශිව පුරාණය**', '**කුමාරසම්භව**', '**දේවකථාලංකාරය**' ආදිය පාර්වතියගේ ලක්ෂණයන් දක්වා ඇති ග්‍රන්ථ වේ. වර්තමානය දක්වාම හින්දු ආගමේ ජන පිරිස් සිය දෛනික අපේක්ෂා, සෞභාග්‍යය උදාකර ගැනීම උදෙසා මෙම පාර්වතී දේව වන්දනය සිදු කරයි. හින්දු දේවතාවියන් අතර පාර්වතී දේවතාවියගේ උත්පත්තිය, ස්වභාවය මෙන්ම ලක්ෂණයන්ද ඉදිරිපත් කර පෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ කොට ගැනේ. පාර්වතී දේවතාවියගේ චරිතයෙහි පවත්නා විවිධ ලක්ෂණයන් පිළිබඳ දැනුමක් බෞද්ධ ජනතාවටත් ලබාදීම මෙහිදී අපේක්ෂිත අරමුණකි. පාර්වතී දේවතාවිය සම්බන්ධව පර්යේෂණය ඉදිරිපත් කිරීමේදී භාවිත කොට ගත් මූලාශ්‍රය ලෙසට සාහිත්‍යමය මූලාශ්‍රය මෙන්ම ඓතිහාසික කැටයම් හා ජන වහරද භාවිතයට ගනු ලබයි.

**ප්‍රමුඛ පදඃ** පාර්වතී, උත්පත්තිය, හින්දු, දුර්ගා

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*isharamadushani41@gmail.com*